CIVIL SOCIETY COLLECTIVE FOR COVID-19 RESPONSE

**කාලෝචිත, විනිවිද පෙනෙන, විද්‍යාත්මක, සාක්ෂි පදනම් කරගත්, ප්‍රවේශ විය හැකි**

**එන්නත් සැලැස්මක් සඳහා සිවිල් සමාජ සංවිධානයන්හී ඉල්ලීම්.**

ශ්‍රී ලංකාවේ පුරවැසියන් සහ සිවිල් සමාජ සාමූහිකයේ සාමාජිකයන් ලෙස පහත අත්සන් තබා ඇති අපි, ශ්‍රී ලංකාවේ එන්නත්කරණ යාන්ත්‍රණය ක්‍රියාවට නැංවීමේ පිළිවෙල පිළිබඳව දැඩි අවධානයෙන් පසුවන්නෙමු. අපි මෙම එන්නත්කරණ ක්‍රියාවලිය පිළිබඳව දැඩි විනිවිදභාවයක් සහ විද්‍යාත්මක ප්‍රවේශයක් ඉල්ලා සිටිමු.

මෙම වසරේ මුල්භාගයේ සිටම එන්නත්කරණය වසංගතයට පිළිතුර වශයෙන් රජය විසින් යොදාගත් 'රිදී උණ්ඩය' විය. විවිධ නිලධාරීන් සහ දේශපාලන නායකයන් විසින් මෙපමණ වූ ප්‍රමාණයක් ජනතාව මෙපමණ වූ කාලයක් ඇතුළත එන්නත් කරනු ලබන බව වරින් වර ජනතාවට පොරොන්දු ලබා දෙන ලදී. සෑම මසකම ඊළඟ එන්නත් තොගය ලැබීමට නියමිත අලුත් කාල සීමාවක් ජනතාවට අසන්නට ලැබුණු අතර, සෑම මසකම එම කාල සීමාව වෙනස් විය. එන්නත් ලබා ගැනීම දුෂ්කර කාර්යයක් බවට සැකයක් නැත. සැපයුම්කරුවන් එන්නත් සැපයීමේ පොරයක නියැලී සිටියත්, ලොවපුරා එන්නත් සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව පවතී. එහෙත් අප කලාපයේ අසල්වැසි රාජ්‍යයන් සමඟ සසඳන විට, ශ්‍රී ලංකාව මේ දක්වා එන්නත් මාත්‍රා දෙකම ලබාගත් මුළු ජන සංඛ්‍යාවෙන් පසුබෑමකට ලක්ව සිටී.

මේ අතර, ශ්‍රී ලංකාවට ලැබුණ එන්නත් සුළු ප්‍රමාණය වුවද බෙදා හැරීමේ ක්‍රියාවලිය මුල සිටම දැඩි මතභේදයට තුඩුදී ඇත.

ආරම්භයේදී එන්නත් බෙදාහැරීම යම් විද්‍යාත්මක ප්‍රමුඛතාවක් දෙමින් සිදුකිරීමට තිබුණත්, දෙවන මාත්‍රාව ලබා ගැනීමට කලින් සිතුවට වඩා කාලයක් ඇති බව පවසමින් පොදු මහජනතාව අතරට එන්නත්කරණ ක්‍රියාවලිය එක් රැයක් තුළ පුළුල් කරමින් රජය විසින් මෙම ප්‍රතිපත්තිය පෙබරවාරි මැදභාගයේදී අත්හැර දමන ලදී.

එන්නත ලබාගත හැක්කේ කොතනද, කවදාද යන තොරතුරු ජනතාව අතරට ක්‍රමානුකූලව සන්නිවේදනය නොවීම හේතුවෙන් මුල සිට ඒ පිළිබඳව ව්‍යාකූලත්වයක් පැවතිනි. තම ප්‍රදේශයේ එන්නත් ලබාදෙන දින වකවානු දැනගැනීම සඳහා 'සාවද්‍ය තොරතුරු' සහ 'ව්‍යාජ පුවත්' පැතිරීම සම්බන්ධයෙන් නිරන්තරයෙන්ම බලධාරීන්ගේ දෝෂ දර්ශනයට ලක්වන ෆේස්බුක්, වට්ස්ඇප් වැනි සමාජ මාධ්‍යය මතම ජනතාවට විශ්වාසය තැබීමට ඉඩ හැරිය. අනෙක් අයට තම අහල පහළින් යන ශබ්ද විකාශන යන්ත්‍ර වෙතම කන් යොමාගෙන සිටින්නට සිදුවිය. ඇත්තෙන්ම, සෑම කෙනෙකුටම සමාජ මාධ්‍යය ගිණුම් නොමැති අතර, ජංගම ශබ්ද විකාශන යන්ත්‍රවලට හොඳ ඇහුම්කන්දීමේ හැකියාවක් හෝ ඉහළ තනතුරුවල යහලුවන් හෝ නොමැත. එන්නත් ලබාදීම පිළිබඳ තොරතුරු පොදුවේ සන්නිවේදනය කර නොමැති අතර, එවැනි තොරතුරු අදාළ සෑම පුද්ගලයෙක් වෙතම විශේෂයෙන් නාගරික ප්‍රදේශවල පුද්ගලයන් වෙත ලැබී ඇද්ද යන්න නොදනී.

පවතින සුළු එන්නත් ප්‍රමාණය බෙදාහැරීමේදී ප්‍රමුඛතාවය තීරණය කිරීමේ යම්කිසි විද්‍යාත්මක පදනමක් අනුගමනය කළ යුතුය. ඇතැම් විට වැඩ කරන ජනතාවට ප්‍රමුඛත්වය ලබාදී ඇති අතර; අනෙක් අතට වැඩිහිටි පුරවැසියන්ට ලබාදී ඇත. තවත් විටෙක මුළු දිස්ත්‍රික්කයටම එන්නත ලබා ගැනීමට පවසන අතර, විටෙක එය යම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයකට සීමා කර ඇත. ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ ප්‍රජා වෛද්‍යවරුන්ගේ සංගමය වැනි විවිධ වෘත්තීය ආයතන එන්නත්කරණ ක්‍රියාපිළිවෙල ක්‍රියාත්මක වන ආකාරයේ පවතින විද්‍යාත්මක පදනමක් නොමැතිබව විදහා දක්වා ඇත. පාරාන්ධ හා විද්‍යාත්මක නොවන එන්නත් ලබා දීමේ ක්‍රියාවලිය එන්නත්කරණයෙන් ලැබිය හැකි සාර්ථක ප්‍රතිඵල අවදානමට ලක් කරනු ලබයි. මෙය සමානාත්මතාව පිළිබඳ ජනතාවගේ අයිතිවාසිකම සහ මෙම ක්‍රියාවලිය පිළිබඳව ජනතාව තුළ පවතින විශ්වාසය බිඳ හෙලනු ලබයි. සෑම පුද්ගලයෙකුටම එන්නත ලබා ගැනීමේ අයිතියක් ඇති අතර, එන්නත් ප්‍රමාණවත් තරම් නොමැති ස්ථානවල විද්‍යාත්මක සාධක පදනම් කරගෙන සාධාරණව එන්නත ලැබිය යුත්තේ සහ නොලැබිය යුත්තේ කවුරුන්ද යන්න තීරණය කළ යුතුය. බලය, ධනය, බලපෑම්, සම්බන්ධකම්, ස්ත්‍රී පුරුෂභාවය, තරුණබව, කිසිදු ශාරීරික දුබලභාවයක් නොමැතිකම යන හේතු සාධක එන්නත ලැබීමට නිර්නායක නොවිය යුතුය. තවමත් එන්නත්කරණයේ අක්‍රමිතාවන් පිළිබඳ පුවත් බහුලව පවතී. මොරටුව සහ නාරාහේන්පිට ප්‍රදේශවලදී නිර්ලජ්ජිත අන්දමෙන් එන්නත ලබාගැනීමට අනුග්‍රාහකත්වය දක්වන අවස්ථාවන්ට උදාහරණ ශ්‍රී ලාංකිකයන් දක්නා ලදී. අනෙකුත් පළාත්වලද ප්‍රාදේශීය දේශපාලකයන් විසින් එන්නත් ලබාදීමේ ප්‍රමුඛතාවන් තීන්දු කරන බව සැවොම හොඳින් දන්නා කරුණකි. සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් දේශපාලන බලපෑම් තමන්ගේ රාජකාරිය ඉටුකිරීමට බාධාවක් බව මාර්තු මාසය වැනි මුල් අවධියේදීම පිළි ගන්නා ලදී. මෑතකදී මහජන සෞඛ්‍යය පරික්ෂකවරුන් විසින් රජයේ සෞඛ්‍යය නිලධාරීන්ගේ සංගමයේ නිලධාරීන්ගේ ඥාතීන් හට ප්‍රමුඛත්වය දෙමින් එන්නත ලබාදීමට ගත් තීරණයක් හෙලා දකින ලදී. කෙසේනමුත්, වෘත්තිකයන් හට කිසිදු බලපෑමකින් තොරව තම රාජකාරිය ඉටුකිරීමට අවසර දුන් විට, කළුතර දිස්ත්‍රික්කයේ මොරගහහේන ප්‍රදේශයේ මෙන් විධිමත් හා ක්‍රමානුකූල අන්දමෙන් එන්නත් ලබාදීමේ ක්‍රියාවලි සිදුවූ අවස්ථාද දැකගත හැකිය. මෙවන් ක්‍රියා සැවොම අනුගමනය කළ යුතුය.

*The Civil Society Collective for COVID-19 Response is a collective of civil society organisations that have come together to contribute to the national COVID response efforts. The CSO collective primarily focusses on supporting most vulnerable groups affected by the pandemic with emergency food and hygiene materials. It also advocates on issues that affect these vulnerable groups during the pandemic. The CSO collective consists of 25 district representatives and 15 core group members at the national level coordinating the response of participating CSOs throughout the country. For any details you may contact csocollectivesl@gmail.com*

අපහසු කාල පරිච්ඡේදයන් තුළදී පවා, අති බහුතරයක් ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාවක් මෙම වසංගතයට මුහුණ දීමට සහ එය මැඩ පැවැත්වීමට ගත් උත්සාහයන් වලට රජයට සහයෝගය දක්වන ලදී. එහෙත් එන්නත් ලබාදීමේ ක්‍රියාපටිපාටිය සිදුවන ආකාරය දෙස බලන කල, රජය පිළිබඳව ජනතාවගේ පවතින විශ්වාසය දිගින් දිගටම හීන වෙමින් පවතී.

එමනිසා, අපි වෛරසය ව්‍යාප්ත වීමේ සීඝ්‍රතාව වැළැක්වීමට අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට රජයෙන් ඉල්ලා සිටින අතර;

- ජනතාවට ප්‍රමාණවත් තරම් එන්නත් ලබා ගන්නා බව සහ ක්‍රියාවලිය තුළ තහවුරු කර ඇති සියලු ප්‍රතිසම්පාදන සැලසුම් පිළිබඳව ජනතාව නිරන්තරයෙන් දැනුවත් කරන බව සහතික කිරීමට;

- ලෝක එන්නත්කරණ වැඩසටහන ඔස්සේ පරිත්‍යාග කරන එන්නත් ලබා ගැනීමට සහ පාලනය කිරීමට රජය විසින් ලෝක සෞඛ්‍යය සංවිධානයට ඉදිරිපත් කළ සැලැස්ම ප්‍රසිද්ධියට පත් කිරීමට;

- දැනට පවත්නා සැලැස්ම යාවත්කාලීන කර පුළුල් එන්නත්කරණ උපාය මාර්ගයක් අදාළ සෞඛ්‍යය සහ මහජන සෞඛ්‍යය පිළිබඳ විද්වතුන්ගේ නායකත්වයෙන් සකස් කිරීමට;

- දිස්ත්‍රික්ක, කොට්ඨාශ සහ ගම්වලට ප්‍රමුඛතාව දීමේදී සලකා බලන නිර්නායක පිළිබඳ සැලසුම විනිවිදභාවයෙන් යුක්ත බව සහ ඒ පිළිබඳව ජනතාව දැනුවත් කරන බව තහවුරු කිරීමට;

- එන්නත් සම්පාදනය හිඟ අවස්ථා වලදී එය ලබාදීම සඳහා ජනතාවට ප්‍රමුඛත්වය ලබාදෙන අන්දම පිළිබඳව විද්‍යාත්මක සම්මතයක් ඇති කිරීම. ප්‍රමුඛත්වය ලබාදීමේදී පහත ජන කොට්ඨාශයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න;

    - පළමු පෙළ ක්‍රියාකාරින්

    - වෛරසය ශරීරගත වුවහොත් දැඩි අවදානම් තත්ත්වයට පත්විය හැකි වැඩිහිටි පුද්ගලයන් සහ අනෙකුත් සෞඛ්‍යය (රෝගී) තත්ත්වයන් පවතින පුද්ගලයන්

    - වෛරසයට ගොදුරු වීමේ වැඩි අවදානම ඇති එහෙත් එයට මුහුණදීම හැර වෙනත් විකල්පයක් නොමැති පුද්ගලයන් (උදාඃ අත්‍යවශ්‍ය සේවා සපයන්නන්, කර්මාන්ත ශාලා සේවකයන්, වතු කම්කරුවන් ආදී අය)

- තොරතුරු වලට ළඟාවීමේ ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීමට සහ වැඩිහිටි පුද්ගලයන්, ගර්භනී මවුවරුන් සහ විශේෂ අවශ්‍යතා (ආබාධ) සහිත පුද්ගලයන් මුල් කරගෙන විශේෂ එන්නත්කරණ වැඩ පිළිවෙලක් සකස් කිරීමට;

- මහජනතාවට එන්නත්කරණය පිළිබඳ තොරතුරු බාධාවකින් තොරව සන්නිවේදනය කිරීමට සුදුසු පුළුල් උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම. ජනතාව වෙත එන්නත ලැබෙන වේලාව සහ ස්ථානය වැනි සවිස්තරාත්මක තොරතුරු රූපවාහිනි නාලිකා, ගුවන්විදුලි නාලිකා, පුවත්පත්, කෙටි පණිවුඩ සේවා ආදියෙන් සිංහලෙන් සහ දෙමළෙන් ලැබෙන්නට සැලැස්වීමට;

- එන්නත ලබාගැනීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම සහ කිසියම් ව්‍යාජ හා/හෝ අසත්‍ය තොරතුරු වලට කඩිනමින් පිළිතුරු සැපයීමට;

- සමාජයේ සීඝ්‍රයෙන්ම මෙම තත්ත්වයට ගොදුරු විය හැකි කොට්ඨාශ ආරක්ෂා කර ගන්නා අතරතුරම ශ්‍රී ලංකාව තුළින් කොවිඩ්-19 තුරන් කිරීමට මූලිකත්වය දීමට අපි රජයෙන් ඉල්ලා සිටිමු.

**ආර්ථිකය නැවත ගොඩනගා ගත හැකිය, එහෙත් නැති වන ජීවිත නැවත ලබාගත නොහැකිය.**

වැඩි විස්තර සඳහා විමසන්න

CSO සාමූහිකය වෙනුවෙන්


| | | |
|---|---|---|
| වෛද්‍ය වින්යා ආරියරත්න මහතා | රෝහන හෙට්ටිආරච්චි මහතා | ඉනෝමා කරුණාතිලක මහත්මිය |
| CSO සාමූහික සම-කැඳවුම්කරු | CSO සාමූහික සම-කැඳවුම්කරු | CSO සාමූහික නියෝජිත |
| vinya.ariyaratne@gmail.com | rohana.paffrel@email.com | inoma@lstlanka.org |


*The Civil Society Collective for COVID-19 Response is a collective of civil society organisations that have come together to contribute to the national COVID response efforts. The CSO collective primarily focusses on supporting most vulnerable groups affected by the pandemic with emergency food and hygiene materials. It also advocates on issues that affect these vulnerable groups during the pandemic. The CSO collective consists of 25 district representatives and 15 core group members at the national level coordinating the response of participating CSOs throughout the country. For any details you may contact csocollectivesl@gmail.com*